# අභාවයට යන ලංකාවේ අත්කම්

ජේ. රැද්‍රිගු මහත්මිය

හස්ත කර්මාන්ත වූ කලී මිනිසුන්ගේ දෛනික ජීවිතයේ සම්පූර්ණත්වයක් ඇති කරන්නකි. ජාතියක සංස්කෘතිය ප්‍රකාශණය ද ඉන් කෙරෙනු ලැබේ. ශිෂ්ඨාචාරයන් මණිනු ලබන්නේ මේ කර්මාන්තයන්ගේ උසස් හෝ පහත් හෝ තත්වය මිණුම්දණ්ඩ කොට ගෙන ම ය.

අනාදිමත් කාලයක සිට සිංහලයෝ හස්ත කර්මාන්තයේ අති දක්ෂයෝ වූ හ. අපේ වෙරළ තරණය කළ විදේශිකයන් බොහෝ දෙනෙක් මේ හැඟීම තහවුරු කරගෙන ගියහ.

එක් අවස්ථාවක් වශයෙන් සුමා ඕරියන්ටල් (Suma Oriental) නම් කෘතිය ඉදිරිපත් කළ හැක. ටෙම් පිරිස් එහි මෙසේ සඳහන් කරයි.

''ලාංකිකයන්ගෙන් වැඩිදෙනෙක් හස්ත කර්මාන්තයේ අති දක්ෂයෝ ය. විශේෂයෙන්ම, කම්මල් කරුවෝ–වඩුවෝ ස්වර්ණාභරණ සාදන්නෝ සහ ලියන වඩුවෝ ය.........ජාතියක් වශයෙන් සිංහලයන් උදරය–එමෙන්ම උගත්ය.''

මීට ප්‍රථම වකවානුවලදී ලියැවුනු මෙවැනි කියුම් චීන ඉතිහාසයෙන්ද තෝරාගත හැක.

1815 ආරම්භ කරණ ලද ජාතියට විෂම වූ අධ්‍යාපන ක්‍රමය සහ විශේෂයෙන්ම වර්තමාන පරම්පරාව මේ පිළිබඳව දක්වන මන්දෝත්සාහයත් කරණකොටගෙන අපේ පුරාණ හස්ත කර්මාන්ත කාරයින්ගේ විශිෂ්ය දැනුම අප අතරින් තුරන්ව ගොස් තිබේ.

එපමණක් ද නොව ජාතිය සතු නෛසර්ගික කලාකාමිත්වය සුදුසු අවස්ථාවන් සහ නිසි අනුබලයක් නොමැතිවීමෙන් අප ඇස් හමුවේම වඳවී යන්නේය. දැනේ කර්මාන්ත වලට උපන් හපන්නු වන අප හැඩිදැඩි කම්කරුවන් බවට පරිවර්තනය වීගෙන යන බව පැහැදිළිව පෙනෙන දෙයකි.

ලෝකයේ ඇති නොයෙක් වර්ගයේ කර්මාන්තශාලාවලින් පිටවන බඩු සමහරවිට හස්ත කර්මාන්තයන් නොමැති වීමේ පාඩුව පිරිමසින හෙයින් අප අතරින් තුරන්ව ගොස් ඇති දැනේ කලාවන් සම්බන්ධව පසුතැවිලි වීම අවශ්‍ය නැතත් මිනිසුන් තම අත්වලින් වැඩ නොගැනීම ඉමහත් ඛෙදයට කරුණකි. පුරාණ සිංහල ජීවන ක්‍රමය අනුව සෑම කෙනෙකුම ගොවියෙක් වූ අතර කලාකරුවෙක් ද විය. ස්වකීය ග්‍රාමයේ උන්නතිය සඳහා ඔවුන්ගේ මේ උභය කොට-සින්ම සම්පූර්ණ වූ ජීවිතවලින් ලැබුනේ ඉමහත් පිටුවහලෙකි. එහෙත් අද ඒ තත්වය කණගාටු-දයක ලෙස වෙනස්ව ගොස් ඇත.

පුරාණ සිංහලයන්ගේ යෝධ වැව් සහ ජලාශ සෑදීමේ ශිල්පය–අනුරාධපුරයේ ගෘහනිර්මාණ ශිල්පය සහ එම ගොඩනැගිලිවල බාහිර වූ ද අභ්‍යන්තරික වූ ද අලංකාරය සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති අවශේෂ සූක්ෂම කලාවන් අනුස්මරණ විෂයයෙන් පවා ඈත්ව ගොස් තිබේ.

මේ ශිල්පයන්හි (ටික දෙනෙකු අතර පමණක් ඇති ජල නන්දය හැර) ප්‍රභවය සොයා ගැනීමට උපකාර වන වාර්තාවත් අප සතුව නැත. පුරාණ ගොඩනැගිලිවලට සම්බන්ධ විස්මය ජනක ශිල්පීය දැනුමට උරුමක්කාරයන් වීමට අපට නුපුළුවන්ව තිබේ.

කරුණු මෙසේ හෙයින් සිංහලයන්ගේ මතකයෙන් පවා මැකී ගොස් තිබෙන අවශේෂ කලා ශිල්පයන් කිහිපයකට පමණක් මේ ලිපිය සීමාවේ.



**යකඩ**

අති පුරාණ කාලයේ පටන් සිංහලයා යකඩ උණුකිරීමේ ශිල්පය දැනගෙන සිටියේය. දුටුගැමුණු රජ කාලයේ—යකඩ යුද්ධොපකරණ, ඊතල සහ රථ ශිල්ප—හස්ති ශිල්ප—ධනු ශිල්ප තිබුණු බව ථූපවංශයේ සඳහන්වේ. තිස්සමහාරාම ප්‍රදේශයේ පොළොව

කණිනවිට අවුරුදු දෙදහසක් පැරණි යකඩ උපකරණ සහ පා පටියක යකඩ වලල්ලක් සම්බවුනු බව පාකර්ගේ යහරාව (පිටු 38-39) කියයි.

තවද සර් රොබට් හැඩ්ෆිල්ඩ් මහතා රාජකීය සමිතිය ඉදිරියේ කියවන ලද ලිපියක් සම්බන්ධ සඳහනක්, ස්පොලියා සිලනිකා (Spolia Zeylanica) 1912 කාණ්ඩයේ 148 වැනි පිටුවේ තිබේ. එහි ලංකාවේ නටබුන් නගරවලින් ලබාගතහැකි පුරාණ යකඩවල උදාහරණයක් සම්බන්ධව ෆිල්ඩ් මහතා විස්තරයක් කරයි. පස්වැනි ශතවර්ෂයට අයත් වානේ නියනක් සහ ඒ කාලයටම අයත් යයි නිගමනය කළ හැකි පැරණි ඇණයක් සහ කැත්තක් ද මේ විස්තරයට ඇතුළත් වේ.

මෙම උපකරණ තීරණාත්මක පර්යෙෂණයට භාජනයකළ ඒ මහතා ''අවුරුදු එක් දහසකට ද ප්‍රථම පටන් ලෝහ විද්‍යාව සම්බන්ධව කිසිරටකට දෙවෙනි නොවන උසස් දැනුමක් ලංකාවේ තිබුණු බව'' ප්‍රකාශ කළේය.

ඊජිප්සියන්වරු ඔවුන්ගේ සතරැස් ටැම් සහ පූජනීය ස්ථාන ආවරණය කළේ ඉන්දියානු වානේ වලින් සාදනලද ගුප්ත සලකුණුවලින් බව 1837 ලියන ලද ලිපියක හීත් (Heath) මහතා සඳහන් කර ඇත.

බදුල්ල සහ එහි උපදවන දේ පිළිබඳ දෙස්තර ඔන්ඩට්ජිගේ (Dr. Ondatjee) 1854 ලිපියක සබරගමුවේ කන්ද පල්ල ග්‍රාමවාසින්හට හිමිව තිබුණු විශෙෂ කාර්යය ''යකඩ රාජකාරිය'' යයි කියැවේ.

ඇත්ත වශයෙන්ම නුවර රජුට යකඩ උණුකල ස්ථානය තොලබෝවත්තේ කීනගොඩ නම් ගමය.

තවද ලංකාවේ සෑම පළාතකම වාගේ විසිර පවත්නා කම්මල් නාමයන්, පුරාණයේ සෑම ප්‍රධාන නගරයකම යකඩ කර්මාන්තය තිබුණු බවට සාක්ෂ්‍යයකි.

ලංකාවේ යකඩ ගලක ආදර්ශයක් සහ රත්නපුරේ උණුකරන ලද යකඩ ලෝහවල නිදර්-ශකයක් ද යැවූ 1886 ලංඩනයේ පැවැත්වුනු ඉන්දියානු සහ යටත්විජිත සම්බන්ධ ප්‍රදර්ශනයේ (Colonial and Indian Exhibition) අත් පොතේ ''ලංකාවෙන් යවනලද ලෝහවල මොලිබ්ඩනම් (Molybdenum) ඇති නිසා පහසුවෙන් උණුකළ හැකි බවත් නුවර වානේ උණුකරන්නන් විසින් නිපදවන ලද දේ තත්වය අතින් ස්වීඩනයේ වානේ මෙන් උසස් බවත් විශ්වාස කර ඇත.

කම්මල් කාරයෝ සහ යකඩ උණුකරන්නෝ වෙනස් වූ කුල දෙකකට අයත් අය වූ හ. ආනන්ද කුමාරස්වාමි මහතාගේ අදහස අනුව ''යමන'' කුලයේ අය යකඩ උණු කළහ. වානේ උපකරණ නිපදවූ අය ''නවන්දන්න'' කුලයට අයත්විය. කුලය අතින් ''නවන්දන්න'' කුලයේ අය ''යමන'' යනට වඩා උසස් යයි සළකණ ලදී.

ගොවි කර්මාන්තය කරගෙන යෑම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන උපකරණ සෑදීමේදී කම්මල් කරුවෝ අති දක්ෂයෝ වූ හ. එසේම, දියුණු යයි සම්මත මේ කාලයේ පවා දුර්ලභ යයි සැලකෙන, කලාත්මක භාවය, ශිල්පයේ නිපුණභාවය හා ප්‍රයෝජනවත් කමට සාධකවූ සුන්දර පිහි කිණියි පත්හිඳ ලෙහෙසියෙන් ගැලවිය නොහැකි යතුරු-යන්ත්‍ර-සරණේරු ආදිය මොවුහු නිපදවූහ. මේ උසස් කලාකාරයෝ තම අතින් බිහිවුනු පිහි-කඩු වැනි දේවල තලයට පමණක් නොව මිටටද සැලකිල්ලක් දැක්වූ අතර ඒවා රිදී ඉටි ඔබ්බවා කලාත්මක භාවය ද ගෙන දුන්නෝය.

මේ සඳහා උදාහරණයන්, උඩරට ප්‍රධානීන්ගේ නිවෙස්වල අද ද එමට දක්නට ලැබේ. සිංහලයන් ගේ මේ විශේෂ කර්මාන්තය ගැන සඳහන් කරන 1886 පැවැත්වුන ලංඩන් ප්‍රදර්ශන-යේ වාර්තාව මෙසේ කියයි. ''පෘතුගීසීන් විසින් ස්වදේශිකයන්හට හඳුන්වා දෙන ලද තුවක්කු වැනි යුද්ධොපකරණ, දුටු සිංහලයෝ, සමහරවිට ඔවුන්ගේ ආයුධ වලට වඩා ප්‍රයෝජන ගත හැකි ලෙස ඒවා නිපදවූහ.''

''ස්වදේශිකයන්ගේ කර්මාන්ත ගැන සළකනවිට යකඩ උණු කිරීමේ පිළිවෙල ඉතාමත් පහසු වූවකි. උවමනා උපකරණ බොහොමත්ම ටිකය.'' මෙසේ කියන්නේ ෆිරියර් (Freer) මහතාය.

1821 ලංකාව සම්බන්ධව දෙස්තර ඩේවි විසින් කරණ ලද ග්‍රන්ථයේ සිංහලයා යකඩ උණු කරණ ක්‍රමය ගැන විස්තරයක් සහ ආදර්ශ රූප සමහරක් ද ඇතුළත් කොට තිබේ.

යකඩ උණුකිරීමේ ක්‍රමය පිළිබඳව ඇති පැරණිම වාර්තාව රොබට් නොක්ස් ගේ ය.

''යකඩ උපදවාගන්නේ, පොලවේ, ඇති යකඩ ලොහවල උපකාරයෙනි. මේවා සිංහල පොලවේ බොහෝ දක්නට ලැබෙන හෙයින් යකඩ කර්මාන්තය දියුණු කිරීම ලාංකික ජනතාව ගේ ප්‍රයෝජනයට ඉවහල් වන්නේය.''

''මේ ගල් තිබෙන්නේ පොලොවේ ඉතාමත් ගැඹුරට වෙන්නට නොවේ. සමහර වෙලාවලදී අඩි 5 ක් හෝ 6 ක් හෝ යට දක්නට ලැබේ.''

## ක්‍රමය

මේ ගල් එක ගොඩක්කොට දරවල ආධාරයෙන් පුළුස්සනු ලැබේ. එවිට මෘදු බවට පත්වන මේවා ගිනිමැටි (ගිනිගල්) සාදන ලද උඳුනට දැමීමට සුදුසු වේ. මේ උඳුනට කිසියම් අඟුරු ප්‍රමාණයක් ද මිශ්‍ර කරනු ලැබේ.

උඳුනට පසුබිම වශයෙන් ආවරණයක් ඇත. එය ගිනි උඳුනේ රස්නයෙන් වැලකීම සඳහා කම්මල් කරුවා සිය පට්ටලයේ සාද ඇති පසුතලයට බෙහෙවින් සමානය. ගිනි උපදවීම සඳහා ඔහු නොයෙක් වර්ගයේ මයිනහම් පාවිච්චි කරයි. ඔහුගේ දෑතින් ගිනි උඳුන පිළියෙල කරන අතරම දෙපා අඩිවලින් මයිනහම ද ක්‍රියා කරවන්නේ දක්ෂකම පලකරමිනි. යකඩ උණු කරන පෝරනුව අඩි 2 1/2 ක් උසය.

නියම වශයෙන් ඉහත සඳහන් ක්‍රමයටම සාදනු ලැබූ උඳුල්ලක් 1921 දී පැවැත් වූ ප්‍රදර්ශන යේ තිබුණි. එද සැලකිය යුතු ප්‍රේක්ෂකයන් අතර වේල්ස් කුමරාය (දැනට වින්ඩසර් ආධිපාද-තුමා) ද විය.

එම උඳුල්ල අද කොළඹ කෞතුකාගාරයේ තිබේ.

දිවයිනේ අතන මෙතන විසිරී ඇති කම්මල්වල පිටරටින් ගෙන්වන ලද යකඩවලින් සහ යකඩ කැලිවලින් සාමාන්‍යයෙන් යමක් කෙරෙතත් යකඩ ගල් උණුකිරීමේ පුරාණ ශිල්පය සහ වානේ කර්මාන්තය සොයා ගැනීමට පුළුවන්කමක් නැත. මේ පිළිබඳව යමක් දන්වන්නේ පුරාණ කම්මල් නාමයන් ද පුරාණ බඩු රැක තබාගෙන සිටින ඇතැම් නිවෙස් ද යුද්ධෝපකරණ සහ සන්නාහයන් සෑදීමේ විස්තර දක්වන පුස්කොළ පොතක් ද පමණකි. වියලි කලාපයේ යකඩ ඉල්ලම් තිබෙන පුරාණ ප්‍රදේශ බොහොමයක් ඝණ වනාන්තර මෙන් වැසී තිබෙන බව දක්නට ලැබේ.

## වානේ කර්මාන්තය

සිංහලයන් සාදන ලද වානේ පොලුවල බර අවුන්ස 15 කි. මේවා එද කෙතරම් ජනප්‍රියව ප්‍රසිද්ධව තිබුණාද යන්න පර්සියානු පෙළඳ පොලවපවා ගෙන යැමට මාර්ගය පෑදී තිබුණ කරුණින්ම මනාව සනාථ කිරීමට සාක්ෂ්‍ය තිබේ.

1856 ඔන්ඩට්ජි මහතා විසින් ලියන ලද ලිපියක සිංහලයන් වානෙ සෑදූ ක්‍රමය මෙසේ කියැ වෙයි.

රණවරා ඇට ඇඹු සමග ගොඳට යකඩ පොලු මැටිවලින් සාදන ලද කවයකට දමනු ලැබේ. වසන ලද නලයක් සමග ගින්නට දමා පය පැය දෙකක් පමණ තබනු ලබයි. එවිට යකඩයට අඩගාරය (Carbon) ලැබේ. යකඩ කොටස් 7 කට රණවරා ඇඹු කොටස් 3 ක යන අනුපාතයට මිශ්‍රණය කිරීමෙන් උසස් වානේ නිපදවෙන අතර යකඩ කොටස් 3 ට කුඩුමිරිස් (Toddalia Occuliater) කොටස් 1 ක් එකතු කිරීමෙන් තරමක් බාල වර්ගයේ වානේ උපදී.

වානේ උණුකිරීම සම්බන්ධව සිංහලයන් විසින් යොදන ලද ක්‍රමය දකුණු ඉන්දියාණුන් වෙත ද දක්නට ලැබෙන බව ඔන්ඩට්ජි (Ondatjee) විසින් පවසා ඇත. ලංඩනයේ පැවැත් වූ මහා රජදක්ම සඳහා මෙසේ සිංහලයන් විසින්ම සාදන ලද වානේ පොල්ලක් යවා තිබේ. එහිදී පැවැත්වූ කථාවකදී මහාචාර්ය රොයිල්ස් (Professor Royles) මහතා පහත සඳහන් විවරණය කළේය.

''අත් පොරොව හැර වෙන කිසිම ආයුධයක පිහිටක් නොමැතිව ස්වදේශිකයා, තම දැතින්ම උණු කිරීම සඳහා යකඩ පිළියෙල කරගනියි. ඉන්පසු යුරෝපයේ සාදන උසස් වානේ සමග හෝ තරග කළ හැකි වානේ බවට හරවයි.''

විශිෂ්ඨ-වැදගත් උගතෙක් වූ හීත් (Heath) මහතා ද එවැනි ම ප්‍රකාශයක් කර තිබේ. ස්වදේශිකයන් ගිනිරස්නය පමණක් පිහිට කොටගෙන පැය 2 1/2 කදී යකඩ වානේ බවට හරවනු ලැබෙතත් එංගලන්තවාසීන්හට එය කිරීමට එම කාලය මඳ වන බව සළකයි. එමෙන්ම ෂෙෆීල්ඩ්හි ප්‍රධාන පෙලේ වායු උදුන්වල ආධාරයෙන් වානේ උණුකිරීම සඳහා පැය 4 ක කාලයක් ගතවේ. ලංකාවේ හා එංගලන්තයේ උපදවන වානේ අතර වෙනස් බව ඇත්තේ වේලාවෙන් පමණක් නොවේ. එංගලන්තවාසීන් යකඩ උණුකිරීම සඳහා රත්වූ නළයට දමන අතර ලාංකිකයා යකඩ නළයට දමා ඉන්පසු උණුකරයි.

ලංකා ආසියාතික රාජකීය සමිතියේ 1856 සඟරාව වැඩි වශයෙන් යකඩ සම්බවෙන ස්ථාන වශයෙන් තොලබෝවත්ත, උඩවාඩිය (නහවිලට නුදුරින්) නීල්පන්කඳුර, කන්දපල්ල හත්ත-වල්ල යන ග්‍රාමයන් නම් කරන අතර වැඩිවශයෙන් යකඩ තැන්පත්ව ඇත්තේ පැල්මඩුල්ලේ බවද සඳහන් කරයි. එසේම, පරණගමට නුදුරුව ඇති කහවිල, යටකොහිල්ල සහ කතරගම මාර්ගයේ කාන්දම් යකඩ ලෝහ දක්නට ලැබෙන බව ද එහිම සඳහන් වේ. ඛණිජ විද්‍යා දෙපාර්තමේන්තුවේ දැනුම අනුව අපට තවත් ස්ථාන බොහොමයක් මේ වට්ටෝරුවට එකතු කළහැකිය.

සැතපුමක් පමණ දිග යකඩ ඉල්ලමක් බලන්ගොඩ තිබුණු බව දෙස්තර ඇන්ඩ්‍රියස් නෙල් (Andreos Nell) මහතා මා සමග කීය.

පාරම්පරිකව පැවත එන යකඩ කර්මාන්තයේ නියුක්තවූවන් දෙතුන් දෙනෙකු කලාමංඩලයේ හස්ත කර්මාන්ත ගබඩාවට සුළු වශයෙන් හෝ භාණ්ඩ සැපයීම කරගෙන එන්නේය. ඔවුනට අවශ්‍ය සියලු ආධාර උපකාරයක් ම අපි ලබා දුන්නෙමු. එසේම මතුවටත් ඔවුන්ගේ කලා කෞශල්‍යය නැතිවීයාමට නොදී ආරක්ෂා කරගැනීම අපගේ පරම යුතුකම වශයෙන් සළකමු. දැනට සේවයේ යෙදී සිටින පිළිමතලව්වේ යූ. ජී. පටබැන්ද සහ බෝවල පුංචි අප්පු මුහන්දිරම් සහ ග්‍රැන්ඩ්පාස්හි රුබෙල් වැනි කලා කාරයන්ගේ උදව්වෙන් මේ කර්මාන්තයේ දක්ෂ උපන් හපන්කම් ඇති තවත් කලාකරුවන් සොයාගෙන යකඩ සහ වානේ කර්මාන්තය දියුණු කිරීමට නිසි අනුබල දීම ලංකා කලාමංඩලයේ හස්ත කර්මාන්ත අංශයෙන් දැනට ගෙන ඇති පියවරකි.

අපේ ගබඩාවට කලා භාණ්ඩ සපයන්නන් පවා අපේ පොළොවෙන් ම යකඩ ලබාගන්නෝ නොවීම කණගාටුවෙන් සඳහන් කළ යුතුව ඇතත්, සිංහළ යකඩ සහ වානේ වලින්ම සිංහළ උදලු, මුරායුධ, නාරස්සන, කයිපුඩි, යතුරු, පොරෝ, කැති සෑදීමට අවශ්‍ය බව ඔවුන්හට පැහැදිලි කර දුන්නෙමු. මේ පිළිබඳ පුරාණ ශිල්පීය දැනුම ඔවුන්ගේ හස්තයේ නැතිබව අපට පෙනේ. සිංහළයන්ගේ අවාසනාවක මහත්!

## කඩදාසි සෑදීම

ටිබැට් රටේ චීනුන්ගෙන්, සිංහළයෝ කඩදාසි සෑදීමේ ශිල්පය උගත්තාහුය. පාහියන්ගේ ලංකාගමනයට පෙර පටන්, චීන ලංකා දෙරට අතර වෙළඳාම කෙරුනු බව පෙනේ.

ලංකාවෙන් ගෙන්නා ගන්නා ලද කිරිමැටි, මුතු සහ කුළුබඩු පිළිබඳව චීන ඉතිහාසයේ සඳහනක් කර ඇත. (දකුණු ඉන්දියාවේ විදේශීය සටහන්—නීලකාණ්ඨ ශාස්ත්‍රී) ලාංකික බඩු සඳහා පුරාණ චීනයේ නිදහස් වෙළඳ පොළක් තිබුණා පමණක් නොව දෙරට සිටි හස්ත කර්මාන්තකාරයෝ වෙළඳ රහස් ද හුවමාරු කරගත්හ. චීනයේ ඈත නැන්කින් (Nankin) වලට නුදුරින් ඇති ප්‍රදේශයක, අද පවා දක්නට ලැබෙන බුද්ධ ප්‍රතිමාවකි. මේ ගැන මඳක් සැලකීම ඓතිහාසිකව වැදගත් ය. යටකියන ලද දර්ශණීය බුද්ධ ප්‍රතිමා තෙළා ඇත්තේ ලංකාවේ, නිල් දණ්ඩ හින්න නම් ගමින් සොයාගන්නා ලද එකම එක නිල්ගරුඬ ගලකිනි. ඒ පිළිබඳ කථාව මෙසේය. ''මහානාම රජුකල (කි.ව. 405) ලංකාවෙන් චීනයේ, ටසින්ස් (Tsins) ආධිපාදතුමා වෙත මේ බුදු පිළිමය යවන ලදි. එවක් පටන් මේ ප්‍රතිමාව, චීනයේ හැම තැනකම දක්නට ලැබෙන බුද්ධ රූපවලට ආදර්ශ රූපය (model) විය.

මීට කලකට පසු සිංහලයෝ, කඩදාසි සෑදීමේ ශිල්පය චීනුන්ගෙන් උගෙනගෙන ලංකාවට ගෙනාහ.

කන්ද උඩරට රාජ්‍යයේ අන්තිම කාල පරිච්ඡේදයේ දී, නුවර දිස්ත්‍රික්කයේ අතළොස්සක් පවුල් අතර මේ කර්මාන්තය පිළිබඳව දැනීමක් තිබුණි. එද කඩදාසි සෑදීම කළේ (ඔන්ඩට්ජිගේ 1854 ලිපියක ඇති පරිදි) ''රාජකාරිය'' වශයෙනි. එනම් මාළිගාවේ ප්‍රයෝජනයට පමණක් කඩදාසි සෑදීමය.

1803 ලියන ලද ''නුවර වැටලීම'' (Kandy Campaign) නැමති කෘතියක, නුවර මාළිගාව බ්‍රිතාන්‍ය සේනාව විසින් කොල්ල කෑ අවස්ථාවක විස්තරයක් වේ. එම විස්තරයෙහි ජේම්ස් කොඩිනර් (Rev. James Cordinner) පියතුමා මෙසේ කියයි. මාළිගාවට ගිනිතබා කොල්ලකෑම ඇරඹූ වේලෙහි, ගල් වගයක් අතර තිබී, මෘදු-සුදු කඩදාසි තොගයක් සම්බවිය. මේ කඩදාසි සාදගන්නා ලද්දේ දිවයිනේම ඇති ගස්වල අරටුවලිනි. මේ කඩදාසි මිටි, රෝල් වශයෙන් තිබුණු අතර සමහරක් දිගින් අඩි විස්සක් ද විය. මාළිගාවේ ගබඩාවල දැනුදු මේ නුවර කඩදාසි තිබෙනවා දක්නට හැක.

බ්‍රිතාන්‍ය ජාතිකයන්, ලංකාවේ, ආධිපත්‍යය තහවුරු කරගත්තේ යම් කාලයකද ඒ අවාසනාවන්ත කාලයෙන් පසුව කඩදාසි සෑදීමේ සිංහළ ශිල්පය ක්‍රමයෙන්, වැළැවී ගියේය. ලාංකික උරුමයක් ඇති සැලකිය යුතු කුමන දෙයක් හෝ සැඟවී තිබෙන විට එයට ආලෝකය ලබාදීමේ වගකීම කරට ගත්, පරම්පරාවෙන් ලන්දේශියකු වූ දෙස්තර ඔන්ඩට්ජි මහතා නොසිටින්නට සිංහලයාගේ කඩදාසි නිපදවීමේ ශිල්පය පුරාවෘත්තයක් පමණක් වන්නට ඉඩ තිබුණි.

මාළිගාවට ප්‍රයෝජනය සඳහා කඩදාසි සෑදූ ග්‍රාමය සහ ඒ කලාකරුවන්ගේ පෙළපතින් පැවත එන්නවුන් ද ඔහු විසින් සොයාගන්නා ලදී. ඔන්ඩට්ජි මහතා එතැනින් නොනැවතී තවත් ඉදිරියට ගියේ ය. 1860 දී පැවැත්වුනු රාජකීය ආසියාතික සමිතියට අවුරුදු 50 ක් පමණ නුවරවැසියන් විසින් සාදන ලද කඩදාසිවලට ආදර්ශ දෙකක්ද—උඩරට රජුගේ කලාකරුවන් විසින් කඩදාසි සෑදීමේ දී යොදනලද කාහටත් ලෙහෙසියෙන් හඳුනා ගතහැකිවූ ශිල්ප ක්‍රමය සවිස්තරව දැක්වීම සඳහා ඒ මහතා විසින්ම සාදන ලද කඩදාසි ප්‍රමාණයක්ද ඉදිරිපත් කළේය.

ස්වදේශිකයන් කඩදාසි සාදන ක්‍රමය සහ ඔවුන් ඒ සඳහා ප්‍රයෝජනයට ගන්නා අමු ද්‍රව්‍යයද සම්බන්ධ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් පහත සඳහන් වාර්තාව ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරණ ලදී.

## අවශ්‍ය ද්‍රව්‍යය

නුවර අවට වනාන්තරවල වැවෙන ගයක අරටුව, මේ සඳහා ගනු ලැබීය. මේ ගස නම් නැනිතොල් නමින් හැඳින්වෙන අට්ටික්කා ගස් ජාතියක් බවත් ඔහු කියයි. නැනිතොල් වශයෙන් සඳහන්වීම සමහරවිට මුද්‍රණකරුගේ හෝ උච්චාරණයේ දී හෝ සිදුවුනු ප්‍රමාද දෝෂයක් විය යුතු බවත් එය වැල් නිතොල් යනුවෙන් විය යුතු බවත් පසුව කරණ ලද පරීක්ෂණවලදී ඔප්පුවී තිබේ. (මුඛ්‍ය පිටපත 1824 මුද්‍රණය).

උඩරට වැසියන් කඩදාසි සෑදූ ක්‍රමය, ඔන්ඩට්ජි මහතා පහත සඳහන් සේ විස්තර කරයි.

පළමුව, වැල් නිතොල් පොත්ත ගලවා, මැටි හට්ටියක දමා එරබදු අලු (Erithima Judica) සමග තම්බයි. ඉන්පසු නිවෙන්නට තබා, මිටියකින් තලා පාන්පිටි තරමට පොඩිකොට, වතුර දමා නානු බවට හරවයි. එයින් පසු පෙණේරයක් ඊට ඔබා එයට හසුවන ප්‍රමාණයක් සමග අව්වේ තබනු ලැබේ. තරමක් වේලුනු ඉක්බිතිව — එය පෙණේරයෙන් ගලවා ගනියි. ඉන් පසුව — එය හුණු බිත්තියක අලවා හොඳටම වේළෙන්නට තබයි.

''ඉහත සඳහන් කළ පරිදි නිපදවන ලද කඩදාසි කාලයෙන් හෝ කෘමීසතුන්ගෙන් හෝ හානියක් නොලබයි. මේ කියමනේ සත්‍යතාවය සනාථ කිරීමට සභාව ඉදිරියේ ආදර්ශ වශයෙන් තබා ඇති අවුරුදු පණහක් පැරණි කඩදාසි දෙක ප්‍රමාණවත් වේ.''

සොන්ඩර්ස් මහතා, කපිතන් හින්ස් මහතා සහ මේජර් ලෙයාර්ඩ්ගෙන් සැදුනු 1860 කාරක සභාව ඒ උදාහරණ වශයෙන් ඉදිරිපත් කළ කඩදාසි පරීක්ෂණයට භාජනය කළහ. ඉක්බිතිව

එම කඩදසි උසස් බවත් — ශක්තිමත් බවත් — පාවිච්චියට ඉතා යෝග්‍ය බවත්, ඒ කඩදසිවල ඇති උසස් භාවයම නිසා ඔප්පු වැනි වැදගත් ලියකියවිලිවලට ප්‍රයෝජන කරගත හැකි බවත් ප්‍රකාශ කළහ.

සිංහලයන් විසින් කඩදසි සෑදීමට ගන්නා ලද අමු ද්‍රව්‍යයන් වශයෙන් දෙස්තර ඔන්ඩච්ජි මහතා සඳහන් කරන්නේ, පැඟිරි තණකොළ (Citronella grass) (abel moschus moschatus) (wild marsh mallow) සහ සිංහල රිටි ගස (sack tree) ය. 1860 දී ඉහතින් කියවුනු කාරක සභාවට උදහරණ වශයෙන් ඉදිරිපත් කරණ ලද කඩදසි සියල්ලක්ම 1857 දී තමා විසින්ම බදුල්ලේ ඉදිකරණ ලද කුඩා කර්මාන්ත ශාලාවේ සාදනු ලැබූ බවත්, එම කඩදසි සෑදීම සඳහා ප්‍රයෝජනයට ගත්තේ නුවර කලාකරුවන්ගේ ක්‍රමයම බවත් දෙස්තර ඔන්ඩච්ජි සඳහන් කර ඇත.

අද ලංකාවේ මතිමාත්‍ර වශයෙන් හෝ මේ කර්මාන්තය තිබේදවත් යන්න සොයාගැනීමට පවා නුපුළුවන් ව තිබේ.

## ආයුධ මුවහත් තබන ගල් සෑදීම

අවුරුදු කිහිපයක් ලංකාවේ ගතකළ දෙස්තර ඩේවි මහතා 1821 දී ලංකාව සම්බන්ධව ග්‍රන්ථයක් ලියා ඇත. මෙම කෘතියේ, දනට අප අතර දක්නට නොමැති ආයුධ වර්ගයක් තැනීමේ ක්‍රමයක් පිළිබඳව ඔහු විස්තර කරන්නේ මෙසේ යි.

සිංහල කම්මල් කරුවෝ ආයුධ මුවහත් තැබීම සහ උපකරණ කැපීම සඳහා එක් ආයුධයක් පාවිච්චි කරති. බලන්නට ඔටිනම එකකි එය. කැප්පෙට්ටිය ලාකඩවලින් සහ (ගල්කුඩු) කොරන්ඩම් (Corundum) වලින් මෙය සාදනු ලැබේ. ද්‍රව්‍යයන් දෙවර්ගයම ලංකාවේ උපදී. මේ වීදුරු ගල්කුඩු (Corundum) සූක්ෂම ලෙස කුඩුකොට කැප්පෙට්ටියා ලාකඩ සමග මිශ්‍රණය කරනු ලැබේ. ඉන්පසු ගිනි රස්නයේ බලෙන් උණු කොට — දියාරුකොට හොඳට කලවම් කලයුතු වේ. එහෙත් රස්නය නිවෙන්නට නිවෙන්නට තදකම, වැඩිවන හෙයින් උණු උණුවේම එය දරවලින් සාදන ලද වාත්තු කරන සැලස්මකට වත්කොට මතුපිට හැඩහුරුකම සහ සිනිඳු බව ඇතිකරන්නේ ය. මෙසේ කල ඉක්බිතිව, ඔටිනාකමින් ද තත්ව-යෙන් ද උසස් විදේශිය ඒවා සමග වුවද තරඟකළ හැකි ''ගලක්'' බවට පත් වේ.

''අලුපොත සිට සැතපුම් 12 කට පමණ ඇතින් පිහිටි බටගම්මන ග්‍රාමවාසීන් මේ හස්ත කර්මාන්ත විෂයෙහි දක්වන්නේ පෞශ්වර්යමත් දක්ෂකමකි. මේ කර්මාන්තය සඳහා අවශ්‍ය ඛණිජ ද්‍රව්‍ය අගරේ කඳුර නම් ගංගාව තුල දක්නට ලැබේ'' යයි කියන දෙස්තර ඔන්ඩච්ජි මහතා ''ස්වදේශිකයන් ආයුධ මුවහත් තබන ගල නිපදවීමට ඛණිජ වස්තු සහ ලාකඩ උපයෝගී කරගන්නා බවත් ලාකඩ උණුකර ක්‍රමයෙන් කැප්පෙට්ටියා කුඩු සමග මිශ්‍ර කිරියෙන් අනතුරුව හැඩ ගන්වා නොයෙකුත් ප්‍රමාණයට කොටස් කර මේ ගල් නිපදවන බවත් අන්තිම වශයෙන් හොඳටම නිවුනු පසු ඉතාමත් ඝනකම, තදකම ඇති බවත් පවසයි.

## මාතර දියමන්ති

මාතර දියමන්තිය වූකලී පොළොවෙන් නොව ඇතින් උපද්දවන කෘත්‍රිම (Semi Synthetic Stone) ගලකි. මේ දුඹුරු වර්ණ නිල් දියමන්තිය ආභරණ සාදන සිංහලයෝ රිදීවල ඔබ්බන්නේ කෙතරම් දර්ශණීය ලෙසද කියනොත් අද පවා — දියමන්ති එකතුකරන්නෝ, දිවයින පුරා පිරා යමින්, ඒවාම සොයති.

මාතර දියමන්ති සෑදීමේ ගුප්ත දනීම අද අප අතර නැත. අපේ රටේ දෙය කොයි රටේ නිවුණද හඳුනාගැනීමට පුළුවන් වරප්‍රසාදය අප වෙත ලබා දුන් — අපේ කලාකාරයන් අද පවා සිටින බව මාතර දියමන්තිය ගැන සඳහන් කරනවිට ද සඳහන් කළ යුතුව ඇත. අපේ කලා කරුවාගේ, විශේෂ ගුණය එයම වන්නේ ය.

සුන්දර දියමන්තිය (Coveted Diamond) අපේ පතල්වලින් ලැබුණු එකක් නොවේ. එහෙයින් සිංහල කලාකාරයා අලුතෙන් දියමන්ති වර්ගයක් නිපදවූයේය. මෙය සමහර වෙලා-

වලදී විදේශීය දියමන්තිවලට වඩා සුන්දර විය. මෘදු විය — එමෙන්ම තරු මෙන් දිලිසෙන්නේ විය. තෝර මල්ලි නමින් මෙය හැඳින්වෙතත්, එය, ජනප්‍රියව ඇත්තේ ''මාතර දියමන්තිය'' යනුවෙනි. ඔව්හු මේ දියමන්තියේ පසුබිමට ධවල තෝර මල්ලියක් (White tourmaline) තැබූහ.

මේ මාතර දියමන්තිය සෑදීම පිළිබඳ විස්තරයක් පහත සඳහන්වේ. (මෙය උපුටාගන්නා ලද්දේ 1770 ලියන ලද තන්ඩර්බර්ග් ගේ චාරිකාවේ (Thunderberg's travels) පරිවර්තනය-කිනි.) ධවල තෝර මල්ලිය (White tourmaline) නැතිනම්, වඩා ප්‍රසිද්ධ නමින් කියතොත් ''මාතර දියමන්තිය'' සෑමවිටම සුදෝ සුදු කිරි පාටින් යුක්ත විය. එය සර්වප්‍රකාරයෙන්ම පැහැදිලි නැත. මේ කරුණ නිසා බොහෝ විට ගිනි රස්නයේ පිහිටෙන් දියමන්තිය කුඩුකොට එහි ඇති කිරිපාට ගතිය ඉන් බැහැර කරනු ලැබේ. මෙවිට දියමන්තිය සාමාන්‍ය සුදු පාටට හැරී වඩා පැහැදිලි පෙනුමක් ලබාගනියි. ඉන්පසු හුණුවල දවටා දහයියා (Oryza) කුඩුවලට (rice chaffs) දමා පුළුස්සනු ලැබේ. සිංහළ කලාකාරයෝ මේ දුඹුරු සහ නීලවර්ණ දියමන්තිය රිදී සහ තඹවල ඔබ්බවා ඒවායේ අගය දෙගුණ තෙගුණ කළහ.

## සිවිදි හෝ, සුවඳ විලවුන් බහාලන ඇත්දත් භාණ්ඩ සෑදීමේ කර්මාන්තය

මේ පිළිබඳව ස්පොලියා සිලනිකා 8 වැනි කාණ්ඩයේ ඇති සටහනක් මෙසේය.

සිංහළයන්ගේ ඇත් දත් වැඩ අතර, සිවිදි හෝ සුවඳ විලවුන් බහාලන භාණ්ඩ සෑදීමේ ශිල්පය ප්‍රසාද ජනකය. මේවා සෑදීම සඳහා කෑගලු දිස්ත්‍රික්කයේ පවුල් කිහිපයක්ම හාරව සිටින අතර දනුදු මේ ශිල්පය අප අතර තිබේ. මේ ඇත් දත් නොයෙක් භාණ්ඩ බවට පෙරලීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යය සොයාගත්තේ කොතරම් විශ්මය ජනක ලෙසද යත් ඇත් දත් මිරිකිය හැකි දියර බවට හරවාගැනීමට ඒ ද්‍රව්‍යය සමත් වී තිබේ. එහෙත්, යම්තම් ඇඹිල්ලක් හෝ වැදුනොත් එහි දියාරු බව බැහැර වෙන්නේය.''

උස්සාපිටියේ කැලරන්ස් රත්වත්තේ මහතා මේ සිවිදිවලට උදහරණ වන භාණ්ඩ කිහිපයක් ආරක්ෂා කරගෙන සිටීම වාසනාවකි. ඒ මහතා මේ භාණ්ඩ තමා සතු අගය කල නොහැකි සම්පතක් වශයෙන් සලකයි. නොයෙකුත් වර්ගයනට අයත්, අයස්කාන්ත ඇත් දත් කලා කෘතීන් කිහිපයක් කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනය පිණිස ද තබා තිබේ. පුරාණ ලංකාවේ ඇත් දත් ලෙහෙසියෙන් නැමෙන සුළුවිය. මේ ඇත් දත් මෙතරම් මෘදු බවට පත්කිරීමට උපයෝගී කරගත් ශිල්ප ක්‍රමය, අපගේ කලාකාරයන් විසින් බිහිකළ එක් ඓශ්වර්යයකි. මේ ගුප්ත ශිල්පය දනගෙන සිටි අන්තිම කලාකාරයා ද 1914 සිංහළ මරක්කල කොලහාලේ දී වෙඩි පහරකින් මරණය වැළඳ ගත් බවත් දනට මේ දර්ශණීය ඇත් දත් සිවිදි සෑදීමට කිසිවකු නැති බවත් රත්වත්තේ මහතාගෙන් මට දනගන්නට ලැබුණි.

අතරින් පතර ලංකාවේ, ඇත් දත් කැටයම් කලාව දන්නවුන් සිටියද ඔවුනට මේ කාලයේ ලොකුම ප්‍රශ්නය වී ඇත්තේ ඇත් දත් සොයා ගැනීමය. මට එක්තරා අඳුරු දිනයකදී උපශාන්ත පෙණුමකින් යුතු වයෝවෘද්ධ කලාකරුවෙක් හමුවිය. හේ ඇත් දත් කැටයම් කරුවෙකි. ශිල්පයේ හසළ දනුමක් ඇති බව පෙනුණු ඔහු කීවේ, ''අවුරුදු ගණනාවකින්ම ඇත් දත් කෑල්ලක් නොදුටු බවත්, ඔහුගේ දෑතින් වැඩක් ගන්නට ඇත් දත් කෑල්ලක් නැති වීමෙන් දෑත වෙවුලන බවත්,'' ය. මෙය ඔහුගේ කටින් පිටවූයේ — සංවේගයත්, ලතැවිල්ලත්, කලා කෞශල්‍යයත් පලකරමිනි.

අපේ රටේ ඇත් දත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු මගින්, කුණුකොල්ලයට වෙන්දේසි නොකර, ඇත් දත් කැටයම් කලාවේ යෙදීසිටින කලාකරුවන් අතට පත්කිරීමට රජය දිරිගත්-තොත් කලාකරුවාටත් පොදුවේ රටටත් වන්නේ විශාල සේවයක් බව මෙහිලා සඳහන් කරමි.

අපේ වෙළඳ ගබඩාවට ඇත් දත් භාණ්ඩ සපයන සෙල්ලප්පු, ස්වර්ණතිලක, දේවසුරේන්ද්‍ර ජිවත්හාමි හා ගාල්ලේ ජ්ඩින් වැනි කලාකරුවන්හට ඇත් දත් සොයා ගැනීමට ඇති අපහසුකම අපට ඔවුන් වටහාදුන් වාර බොහෝ ය. මොවුන් ඉදිරිපත්කර ඇති ආභරණ, හෙප්පු, පිහියතල, වටාපත් මිටවල් ඔවුන්ගේ දක්ෂකමට සාධක වන අතර ඇත් දත් කලාකරුවන්ට නොලැබී ගියහොත් ඔවුන්ගේ සහජ දක්ෂකම — කලා කෞශල්‍යය පමණක් නොව ඇත් දත් කැටයම් කලාවද මේ ලංකා පොලොවෙන් වැලලී යයිදෝ යි මට වරෙක සිතේ.